


# පුනරාවර්ජනය
## විද්‍යානි මනතුංග ලියූ පළමු කවිපොත




මම කවියෙක් නොවෙමි. මෙය විචාරයක් හෝ විවරණයක්ද නොවෙයි. මට මෙය ලිවීමට සිතක් ඇති වූයේ 2004 දී පමණ එවකට " පහන" සංස්කාරකයන් වූ ජගත් ජේ එදිරිසිංහ සහ වරුණ සාවින්ද දෙදෙනා විසින් පවත්වන ලද මෙරට පළමු සිංහල කෙටිකතා තරගයෙන් පළමු තැන ලබා සිංහල පාඨකයා ඉදිරියට ආ ලේඛිකාවගේ සාහිත්‍ය සංචාරය දෙස මා නිතර අවධානයෙන් සිටි හෙයිනි.

එවකට පර්ත් නගරයේ විසූ ඇය තමාගේ පළමු නවකතාව වූ "හිම බිමේ සුදු රෝස" පළ කරන විට කැන්බරාවට හෙවත් පෙඩරල් රජය යටතේ ආයතනයක සේවය කරමින් සිටියා ය. ඒ 2012 දී ය. (සංස්කාරක සටහන - පසුව පොතක් වශයෙන් එළි දක්වන ලද " හිම බිමේ සුදු රෝස" කතුවරිය සන්නස ට කොටස් වශයෙන් ලියූ නවකතාවකි)

වසර ගණනාවක් තිස්සේ ලියන ලද කවි පනස් ගණනකින් යුත් මේ පොතට කිවිඳිය විසින්ම අඳින ලද සිත්තම් කිහිපයක් ද ඇතුළත් වීම විශේෂ ලක්ෂණයක් වශයෙන් මම දකිමි. ඒ හැකියාව සහිත තවත් දෙනෙක් අපතරේ සිටිති. දෙදෙනාම ඉංජිනේරුවරුන් හැටියට ආජකාරියට බට පුද්ගලයෝය. ජගත් ජේ එදිරිසිංහ කවියකු නවකතාකරුවකු ගීත රචකයකු පුවත්පත් කලාවේදියකු වශයෙන් රසිකයන් පිනවීමට සමත් වූවෙකි. අනෙක් ඉංජිනේරුවා ජනප්‍රිය ගී රචකයකු වන සිසිර දිසානායක ය. සිසිර ලියන ලිපි සියල්ලකම ඇතුළත් සිතුවම් හා රූප සටහන් ඔහු විසින්ම අඳිනු ලැබේ. ලේඛකයකු ලෙසින් ඉදිරිය නො දා අනෙක් ඉංජිනේරුවා පුවත්පත් සඳහා චිත්‍ර ඇඳීම අත්හැර වෘත්තියට බට ගුවන්විදුලි ශිල්පියකු වශයෙන් හැඳින්විය හැකි විජය වික්‍රම කරුණාසේන ය.

මේ තොරතුරු සඳහන් කිරීමට මා තීරණය කළේ ප්‍රස්තුත කිවිඳිය සහ අනෙක් තුන්දෙනාම අංශ දෙකකින් වුව ද විද්‍යාඥයන් වීම නිසා ය. විද්‍යාඥයකු කලාක-රුවකු වශයෙන් මිනිසා සහ මිනිස් ගතිගුණ ද දැකීමටමත් විග්‍රහ කිරීමටත් සමත් බව ප්‍රත්‍යක්ෂ කළ ප්‍රධාන ලේඛකයා ඇන-"ටන් චෙකොෆ් යයි සිතමි. මිනි සාටත් මිනිස් කමටත් දැඩි ඇල්මක් - බැඳීමක් ඇතිවීම වෛද-යවරයාගේ විශේෂ ලක්ෂණයක් හා සුදුසුකමක් වන්නාක්මෙ මෙන්ම කවියා - ගීත රචකයා නොහොත් අන් කවර ආකාරයක හෝ කලාකරුවාද ඒ මුදු ගුණය - මිනිස් බවට දක්වන ලැදියාව සහිත වූවෙකි. ඒ ගුණය විරහිත පුද්ගලයා වෙතින් පැතිය හැක්කේ මිනිස් බවට හා සමාජයට හිතකර - මිනිස් මනස පුබුදුවන නිමැවුම් නොවන බව මම කල්පනා කරමි.

විද්‍යානි මනතුංග ලියන පෙරවදනෙහි (ඇය එය හඳුන්වන්නේ "පිළිසඳර" යනුවෙනි) මම ඒ මුදු ගුණය දකිමි.

"මම වැටි වැටී නැගිටිමින් හැඬුවේත් සිනාසුණෝත් ඔබ වැනිම වූ හදවතකිනි. එබැවින් මගේ කවි ඔබ හදවත සතුටු කරන්නට මෙන්ම පාර-වන්නටද රිදවන්නටද එකසේ ඉඩ තිබෙන බව දනිමි"

"එහෙත් මම කිසිවකු තුටු කිරීම සඳහා කවි නොලිවෙමි. කිසිවකුට රිදවීමටද පහර ගැසීමටද එසේ නොකළෙමි. .... එසේ කළේ නම් සිදු වීමට ඉඩ ඇත්තේ මා වැන්නකු යටපත් කර දමා මා නොවන අනෙකෙකුගේ මතුව ඒමකි. එහි දී රැවටීමට හසුවන්නේ ඔබේ නොවේ මගේම සිත ය."

කලාකරුවාගේ - කවියාගේ මෙහෙවර කිසිදිනෙක නිමා නොවන්නකි. ඔහු හෝ ඇය හෝ නැවැත් වූ තැන සිට ඉදිරියට ඒ මෙහෙවර කරගෙන යාමට තව තවත් කලාකරුවෝ කවියෝ පෙ-රමුණට එන්නෝය. ඒ බව කියන කවියකින් ය ඇය තමාගේ කවි එකතුව හමාර කරන්නේ.



විරාගය

දුරින් හිඳ ආදරය පුද දෙ ත
පැතුම් මත හැඟුමන් නොවස්ස ත
බමණ ලොව තුළ ඔලාරික වූ ණ
සබඳ නෙත සිත ඔබෙයි ලස්ස ත

පිපුණු අරවින්දයකි දිස්ව ත
නමුදු ඉඳුරන් විරාගික වී ත
අකම්පිත වූ හදේ පුදසු ත
ප්‍රකම්පිත වී හඬා නොවැටී ත

සබඳ ඔබගේ දැමුණු දෙනය ත
රාග ගිනි මැද කිලිටි නොම වී ත
ලොව ම රවටා අදිසි නොම ව ත
සැබෑ බෝසත් ඔබ ම වනු මැ ත

"නන්නාඳුනන ඔබට" යන හිසින් වූ ඒ කව අවසන් කරන්නේ මෙසේය.
ගිලිහුණත් මා අතින් මෙපන්හිඳ මතු දිනෙක
මම රැඳෙමි නුඹ අතින් ඉපැද්දෙන කවි සමග
මිනිස් ලොව - මිනිස් දැය - නොකළ යුතුකම් කොටස
මගෙන් පසු නුඹ සතුය නොමළ ඒ හෙට දවස"

"වර්ගවාදය" නමින් එන කව කියවන විට මගේ සිහියට නැගුණේ මෙය ලියන දිනයේම දුටු පුවතකි. මඩකලපුවේ මංගලාරාමයේ භික්ෂුවක් දෙමළ ග්‍රාමසේවකයකුට තරවටු කරන දර්ශනයකි. භික්ෂුව පැවසූ වචන මෙහි ලිවීම නුසුදුසුය. යට කී සේවකයා මරණ බවට තර්ජනය කිරීම ඒ පෙදෙසේ වාසය කරන බහුතර ජන කොටස් දෙකම තදින් හෙළා දුටු බව පමණක් කියමි. මේ කව අර කියාපු භික්ෂුවට පමණක් නොව තර්ජනයට හා ගර්ජනයට පුරුදුව සිටින තවත් බොහෝ භික්ෂුන්ටද පාඩමක් උගන්වන්නකි. ගිහියන්ට වුවත් පත්තියම් වනු නියතය.

මේ වර්ග කරගැනීම්
කොතැනක ද..?
වෙනස් තැන්වල
වෙන් ව හිඳගෙන නමුත්
එක දෙයක් ගැන
එකම අදහස් දරන විට

කලු සුදු කළඑළලු
නොයෙක් පැහැ
හැම හමට ඇතුළතින්
ඇතුළු හද
එකම හැඟුමක එරී
එකම අඳුරක් පිටු දකින විට...

**Land Sale in Sri Lanka**

**Ethul Kotte**

20 Perch bare land at Maligawa Road, Etul Kotte, 50m From Main Kotte - Nugegoda Road. Near Telecom, Post Office & Cargills Food City.

Contact: 0448756944

Land for Sale

**Gampaha**

Quiet residential area in 47 Perches of land with a old house off Church Road.
7 minutes to town.

Valued only for land Rs. 700,000 per Perch .

call : 0435879888 or
email : wskper56@gmail.com